# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/15 - 2020 ජනවාරි මස 22 වැනි බදාදා - 2020.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) වැනි ව්‍යවස්ථාවට හා 46(1) (අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2019 දෙසැම්බර් මස 10 වැනි දිනැති අංක : 2153/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන නිවේදනය, වහාම ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2020 ජනවාරි මස 21 වැනි දින.
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (12) "තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි අංක (12) ශීර්ෂය, "(12) තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍ය" වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි I අයිතමය -

1. "තොරතුරු හා ජනමාධ්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ III වැනි තීරුවෙහි සඳහන් නීති හා අණපනත් වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම" වශයෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි 8 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

1A - G 31843 — 382 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

(ඈ) එහි I වැනි තීරුවෙහි අයිතම 7 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි II වැනි තීරුවෙහි 3 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි අයිතම 2 සිට නැවත අංකගත කිරීමෙන් ;

(2) එම නිවේදනයෙහි අංක (I) "ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 18 අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

19. තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය ප්‍රවර්ධනය සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 19 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි 26 අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

27. සියලුම තොරතුරු තාක්ෂණ උද්‍යාන

(ඈ ) එහි II වැනි තීරුවෙහි අයිතම 27 සිට නැවත අංකගත කිරීමෙන් ;

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.